කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
Established 1984

# භාග්‍යා අබේරත්න වටා වූ කතිකාව පිළිබඳ ප්‍රකාශය

**2021 මාර්තු**

භාග්‍යා අබේරත්න පිළිබඳ කතිකාව සහ පරිසර විනාශය පිළිබඳ ඇය විසින් ජාතික රූපවාහිනී නාලිකාවක දී කරන ලද ප්‍රකාශය වටා වූ නොයෙක් සාධක, සැලකිල්ලට ලක්වන කාරණාවක් බවට පත් වී ඇත.

සමාජ සාධාරණත්වය සහ මාධ්‍ය සදාචාරය වෙනුවෙන් පෙනී සිටින සංවිධානයක් වන, කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය වශයෙන්,  අපි, මිනිසුන්, රජය සහ මාධ්‍යය ඇයට ප්‍රතිචාර දැක්වීමට තෝරාගත් ආකාරයේ ඇති ගැටලු සහගත කරුණු පිළිබඳ පහත කරුණු ඉස්මතු කිරීමට අපේක්ෂා කරන්නෙමු.

විෂය භාර ඇමතිවරයා ඇයගේ ප්‍රකාශය නොවැදගත් සේ සළකා ඉවතලීමට යුහුසුළු විය. එවැනි ප්‍රකාශයක් සිදු කිරීමට පෙර ඇය විසින් එම කරුණු සත්‍ය බව තහවුරු කරගෙන සිටිය යුතු බව ඔහු විසින් විශේෂයෙන් කියා සිටි අතර සිංහරාජ වනාන්තර විනාශය පිළිබඳව ඇය විසින් හෙළි කළ අනුවේදනීය කාරණා කිසිවකට ඔහු විසඳුමක් ලබා නොදුණි. ඔහුගේ ප්‍රතිචාරයෙන් ඇය ඇගේ සැබෑ අත්දැකීම් තුලින් ප්‍රකාශ කළ දේට වටිනාකමක් නොදුන් අතර ඇය විසින් සත්‍ය කරුණු ඉදිරිපත් නොකළ බව පවසමින් එම ප්‍රකාශය හෑල්ලුවට ලක් කළේය. ඇගේ ප්‍රකාශය සහතික කර ගැනීමට වනජීවී නිලධාරීන් භාග්‍යාගේ නිවසට ගොස් ඇත. මෙයට අමතරව, ඇගෙන් ප්‍රකාශයක් වාර්තා කර ගැනීම සඳහා පිරිමි පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ද ඇගේ නිවසට ගොස් ඇති බවට වාර්තා වී ඇත. රජයේ මෙම ක්‍රම මගින් දිගින් දිගටම භාග්‍යා හට හිරිහැර කර ඇති අතර ඇයට නැවත නැවතත් ඇගේ ප්‍රකාශය වෙනුවෙන් පෙනී සිටීමට සිදුව ඇත.

ඒ හා සමාන සටහනක මන්ත්‍රීවරයා විසින් ඇයව “තරුණ දැරියක” ලෙස හඳුන්වා ඇති අතර එම ප්‍රකාශය බුද්ධිමත් ප්‍රකාශයක් නොවන ලෙස සලකනු ලැබීම සඳහා ඇගේ තරුණ බව හේතුවක් වන බව ද සඳහන් කොට ඇත. මෙයින් පෙන්වා දෙන්නේ තාරුණ්‍යයේ සහ කාන්තාවන්ගේ බුද්ධිය, අභිලාශය සහ පොදු උද්‍යෝගය හඳුනාගැනීමට සහ එයට වටිනාකමක් දීමට රජය පාර්ශවයේ ඇති අසමත්බවයි.
මෙම පහත් කොට සැලකීමේ සහ අවමන් කිරීමේ ආකල්පය මධ්‍යයේ ඇතැම් කොටස් මගින් ස්ථිර කොට ඇත. එක් පුවත්පතක මෙම සිද්ධිය “පුංචි භාග්‍යා” ලෙස ආරම්භ වන සිරස්තලයක් සහිතව, ජාතික වශයෙන් වැදගත් කාරණා ගැන සැලකිලිමත් වන වැඩිහිටියකු වශයෙන් ඇගේ පරිණතභාවය හෝ නියෝජනය පිළිගත නොහැකි ලෙසට වාර්තා කර තිබිණි. අප ද භාග්‍යාගේ සහ ඇගේ පවුලේ මාධ්‍ය ආවරණයක් ඔවුන්ගේ නිවසේදී සිදු කිරීම පිළිබඳ ප්‍රශ්න කරන්නෙමු.  සංවේදී

56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව
சரசவி லேன், காசல் வீதி, கொழும்பு 8, இலங்கை.
Sarasavi Lane, Castle Street, Colombo 8, Sri Lanka

Telephone: +94-11-2690192, 5632045, 5635900, 5635800, 2690201, Fax: +94-11-2690192, 2690201, Email: wmcsrilanka@gmail.com
www.womenandmedia.org  facebook.com/womenandmediacollective  twitter.com/womenandmedia

Registration No. GA 2476

කැමරා කෝණයන්ගෙන් ඇගේ හැඟීම්බර හැසිරීම් පෙන්වීම සහ ඇගේ මවගේ ප්‍රතිචාර දැක්වීම් විශාලනය කොට පෙන්වීම මගින් මාධ්‍යය විසින් උත්සාහ දරා ඇත්තේ ඇය විසින් මතුකළ සැබෑ ගැටලුව පෙන්වීමට වඩා මෙහි ඇති නාට්‍යමය ස්වභාවය පෙන්වීමට බව ඔප්පු වේ.

පසුගිය සතියේ, වසර 126ක් පැරණි සංවිධානයක් වන, වනජීවී සහ ස්වභාව ධර්මය ආරක්ෂා කිරීමේ සමාජයේ තරුණ පිරිස විසින් විහාර මහා දේවි උද්‍යානය අසල සවි කළ ස්වභාවික පරිසරය විනාශ කිරීම පිළිබඳ සිතුවම, ජනාධිපතිවරයාගේ නියමය මත නිලධාරීන් විසින් ඉවත් කරනු ලැබීය (2021.03.19 ඩේලි මිරර් පුවත්පත). මෙම තීරණය සඳහා ජනාධිපතිවරයාගේ මූලික හේතුව ලෙස දැක්වූයේ එම සිතුවම සහිත බැනරය මගින් උද්‍යානය සුන්දරත්වය විනාශ වන බවත් එය පරිසරය සුරකීමේ සාර්ථක ක්‍රමයක් නොවන බවත් ය. නැවතත්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ සාමකාමී ලෙස විරෝධතාවයේ යෙදීමේ අයිතිය රජය විසින් සීමා කොට ඇත.

එමනිසා, රටේ සිදුවෙමින් පවතින පාරිසරික විනාශය පිළිබඳ ගැටලුව පිළිබඳව, විශේෂයෙන්ම සිංහරාජයේ වන ආවරණය ඉවත් කිරීම පිළිබඳව, අවධානය යොමු කරන ලෙසත්, සාකච්ඡා සහ විවාද හෝ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා වන පුද්ගලයෙකුගේ අයිතිය සීමා කිරීම සඳහා තර්ජනය කිරීම් භාවිත කිරීමෙන් වළකින ලෙසත් අපි රජයෙන් ඉල්ලා සිටින්නෙමු. ආචාරශීලී වාර්තාකරණය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන ලෙසත් පරිසරය පිළිබඳ වාර්තා කිරීමට වැඩිපුර සම්බන්ධ වන ලෙසත් තවදුරටත් මාධ්‍යයෙන් ඉල්ලා සිටින්නෙමු.